# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,468 - 2025 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 4394 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 4403 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 09 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සැම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සැම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සැම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සැම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සැම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සැම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සැම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය සභාවේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**

**පුරප්පාඩු - 01**

**පත්වීමේ ස්වභාවය :** ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතයි.

**වැටුප් ක්‍රමය :** සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MA1-1-2025- (රු. 46,220-10x540-7x 630 -4x890-20x1,190-රු.83,390)

*බාහිර අයදුම්කරුවන්:*

අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
(I) සිංහල
(II) ගණිතය
(III) ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් : පරිගණක වදන් සැකසුම් පිළිබඳ මූලික දැනුම

*අභ්‍යන්තර අයදුම්කරුවන් :-*

(අ) ප්‍රාථමික ශ්‍රේණිය/ ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ", "ඈ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකි ය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
(I) සිංහල/ දෙමළ
(II) ගණිතය
(III) ඉංග්‍රීසි භාෂාව
යන විෂයයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර ඉන් විෂයයන් තුනකටවත් සම්මාන සාමාර්ථ තිබිය යුතු ය.

(පරිගණක වදන් සැකසුම්/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකම් වශයෙන් සලකා බලනු ඇත.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

වයස :

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*අයදුම් කිරීමේ ක්‍රමවේදය :* තමා විසින් සකස් කරගන්නා ලද අදාළ කරුණු ඇතුළත් අයදුම්පතක් 2026.01.08 දිනට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු යි.

*සැ. යු. -* ලිපියෙහි ඉහළ වම් කෙළවරෙහි "කළමනාකරණ සහකාර තනතුර සඳහා අයදුම් කිරීම" ලෙස දැක්විය යුතු යි.

**2. තනතුර : කාර්යාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන)**

පුරප්පාඩු - 04

**පත්වීමේ ස්වභාවය :** ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතයි.

**වැටුප් ක්‍රමය :** සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

PL1-2025 (රු. 40,500-10x450-10x490 -7x540-15x590-රු.62,530)

අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් (02) සමත් වී තිබිය යුතු ය.

වයස :

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතු ය.

වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

(iv) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(v) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(vi) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*අයදුම් කිරීමේ ක්‍රමවේදය.-* තමා විසින් සකස් කරගන්නා ලද අදාළ කරුණු ඇතුළත් අයදුම්පතක් 2026.01.08 දිනට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු යි.

*සැ. යු.* - ලිපියෙහි ඉහළ වම් කෙළවරෙහි "කාර්යාල සහායක තනතුර සඳහා අයදුම් කිරීම" ලෙස දැක්විය යුතු යි.

ලේඛකාධිකාරි *(වැ. බ.)*,
හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාව,
අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර,
රාගම.

12 - 342

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ඇබෑර්තු - 2025 වර්ෂය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026 ජනවාරි මස 05 දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම **www.parliament.lk** වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය).

**1 නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) - [පුරප්පාඩු සංඛ්‍යාව - 01]**

**1.1 වැටුප් පරිමාණය:-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව, මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය-

රු. 109,090-7x 2,940 / 6x3,900 - රු. 153,070/- වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.184,000/- පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

**1.2 වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**1.3 අධ්‍යාපන සුදුසුකම්:-**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන වාණිජ්‍යය, කළමනාකරණය හෝ ගණකාධිකරණය පිළිබඳ උපාධියක් තිබීම.

**1.4 වෘත්තීය සුදුසුකම්:-**

(*අ*) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) පිරිනමන ලද මූල්‍ය කළමනාකරණය/ගණකාධිකරණය/ ප්‍රසම්පාදන යන ක්ෂේත්‍රයන්හි ශාස්ත්‍රපති උපාධියක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

(ආ) මුදල් අමාත්‍යාංශය/ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් මෙහෙයවනු ලබන CIGAS සහ ITMIS, පරිගණක වැඩසටහන් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**1.5 පළපුරුද්ද:-**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III/II ශ්‍රේණිවල එකතුව වසර දොළහක් වූ (12) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

**1.6 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතාවය මත.

**පරීක්ෂණ පටිපාටිය:-**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම් සපුරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. ඒ සඳහා වෙන්කර ඇති මුළු ලකුණු සංඛ්‍යාව සියයකි (100):-

| *අනු. අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සේවා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**2 කාර්මික නිලධාරී (විදුලි) - [පුරප්පාඩු සංඛ්‍යාව - 02]**

**2.1 වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 58,660 – 9 x 1,190 / 3 x 1,360 – රු.73,450/- වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 97,000/- පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

**2.2 වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**2.3 අධ්‍යාපන සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිතය විෂයය ධාරාව යටතේ විෂයයන් හතරකින් (පැරණි නිර්දේශය) හෝ නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එක් වරක දී සමත් වී තිබීම;

*සහ*

සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට, ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සහ ගණිතයට සම්මාන සාමාර්ථ ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

**2.4 වෘත්තීය සුදුසුකම්:**

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) (විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ);

*හෝ*

(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) (විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ);

*හෝ*

(iii) ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) (විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ);

*හෝ*

(iv) විවෘත විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ);

*හෝ*

(v) විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළව NVQ 6 සහතිකයක් ලබා තිබීම.

**2.5** පළපුරුද්ද:

පිළිගත් ආයතනයක, ඉලෙක්ට්‍රොනික/ ශ්‍රව්‍ය/ දෘශ්‍ය/ විදුලි සංදේශ/ විකාශනය/ වායු සමකරණ හා ශීතකරණ හෝ සමාන ක්ෂේත්‍රයක කාර්මික නිලධාරියෙකු ලෙස වසර තුනකට නොඅඩු පළපුරුද්ද.

**2.6** බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ පරීක්ෂණ පටිපාටිය :

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි. සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

| අනු. අංකය | නිර්ණායක |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් |
| 02 | අමතර වෘත්තීය සුදුසුකම් සහ විශේෂ කුසලතා |
| 03 | සේවා පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව |

**3** **භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි/සිංහල) - [පුරප්පාඩු සංඛ්‍යාව 05]**

**භාෂා පරිවර්තක (සිංහල/දෙමළ/සිංහල) - [පුරප්පාඩු සංඛ්‍යාව 02]**

**භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ/ඉංග්‍රීසි) - [පුරප්පාඩු සංඛ්‍යාව 03]**

**3.1** මාසික වැටුප් පරිමාණය:-

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරුවලට හිමි මාසික වැටුප් පරිමාණය රු. 54,560-3 x 680/10 x 800/4 x1,190 - රු. 69,360/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 92,000.00 පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

දැනටමත් රජයේ සේවයේ නියුතු සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවකු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සඳහා වසරක වැඩබැලීමේ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ඔහුගේ/ඇයගේ වැටුප් පියවර පෙර වැටුප අනුව සකස් කරනු ලැබේ.

**3.2** වයස් සීමාව:-

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**3.3** අධ්‍යාපන සුදුසුකම්:-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම (පැරණි නිර්දේශය) / එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම (නව නිර්දේශය);

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයය සහ අදාළ භාෂා විෂයය ධාරා ඇතුළත්ව විෂයයන් 5ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම.

(අදාළ භාෂා විෂය ධාරාවන් - භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි/සිංහල) තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල සහ ඉංග්‍රීසි භාෂා සඳහා සම්මාන සාමාර්ථ ද, භාෂා පරිවර්තක (සිංහල/දෙමළ/ සිංහල) තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල සහ දෙමළ භාෂා සඳහා සම්මාන සාමාර්ථ ද, භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ/ඉංග්‍රීසි) තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට ඉංග්‍රීසි සහ දෙමළ භාෂා සඳහා සම්මාන සාමාර්ථ ද තිබිය යුතුය).

**3.4** වෘත්තීය සුදුසුකම්:-

පරිගණක සාක්ෂරතාවය පිළිබඳව පිළිගත් ආයතනයකින් සහතිකයක් ලබා තිබීම.

**3.5** පළපුරුද්ද:-

ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රජයේ හෝ පිළිගත් ආයතනයක භාෂා පරිවර්තක තනතුරක වසර 5කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**3.6** බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

(අ) ලිඛිත පරීක්‍ෂණය

ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට සහභාගි විය යුතුය. මෙම පරීක්ෂණය මඟින් භාෂා පරිවර්තනය පිළිබඳ අයදුම්කරුවන්ගේ කුසලතා ඇගයීමට ලක් කෙරේ. මෙම පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

(ආ) සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි. (100)

| අනු. අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |
| 4 | සන්නිවේදන කුසලතා |
| 5 | පළපුරුද්ද |

## 4 රෙදිපිළි කාමර සේවක - [පුරප්පාඩු සංඛ්‍යාව - 01]

### 4.1 රාජකාරී ස්වභාවය

පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයෙහි නිල ඇඳුම්, තිර රෙදි ඇතුළු රෙදිපිළිවල පිරිසිදුකම සහ නඩත්තුව සහතික කිරීමට අදාළව ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කටයුතු ඉටු කිරීම මෙම තනතුර හරහා අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, මෙම තනතුරට අදාළ ප්‍රධාන වගකීම් ලෙස නිල ඇඳුම් ඇතුළු රෙදිපිළි පිරිසිදු කිරීම, අලුත්වැඩියා කිරීම සහ නිකුත් කිරීම අධීක්ෂණය කිරීම, රෙදිපිළි සම්බන්ධ වාර්තා හා තොග මට්ටම් නිවැරදිව පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා පවත්වාගෙන යාම, රෙදි සෝදන බිල්පත් පරීක්ෂා කිරීම සහ අවශ්‍ය පරිදි රෙදිපිළි කාලෝචිත ලෙස බෙදා හැරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළත් වේ.

### 4.2 මාසික වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 42,290-9x490/10x540/6x590-රු.55,640/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.80,000/- ක් පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

### 4.3 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

### 4.4 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

(අ) සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම;

*සහ*

හෝටල් ගෘහපාලන ක්ෂේත්‍රයේ NVQ II මට්ටමේ සහතිකයක් ලබා තිබීම;

*සහ*

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත තරු පන්තියේ හෝටලයක රෙදිපිළි කාමර සේවක තනතුරෙහි හෝ රෙදි සේදුම් කර්මාන්ත (ලොන්ඩරි) සේවකයෙකු ලෙස මාස හයකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

*හෝ*

(ආ) සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම;

*සහ*

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත තරු පන්තියේ හෝටලයක රෙදිපිළි කාමර සේවක තනතුරෙහි හෝ රෙදි සේදුම් කර්මාන්ත (ලොන්ඩරි) සේවකයෙකු ලෙස වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා **තිබීම**

****ඉහත සුදුසුකම් වලට අමතරව මැහුම් ගෙතුම් පිළිබඳව ප්‍රායෝගික දැනුම අනිවාර්ය වේ.**

### 4.5 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය :

උක්ත තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලත්

අයදුම්කරුවන් මෙම ලිඛිත/වෘත්තීය පරීක්ෂණයට මුහුණ දිය යුතුය. මෙහි දී රෙදිපිළි ගබඩා කිරීම, රෙදිපිළි සේදීම, රෙදි මැසීම යන ක්ෂේත්‍රයන්ට අදාළව අයදුම්කරුවන්ගේ කුසලතා නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙහි දී පැය 1 ක ලිඛිත/ වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියයකි. (100)

(ආ) සම්මුඛ පරීක්‍ෂණය :

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියයකි (100)

| *අනු. අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

**5. සේවා නියමයන් හා කොන්දේසි**

(i) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු ය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත් ව පත්කරනු ඇත.

(ii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට බලය ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්‍ෂණයකට භාජනය විය යුතු ය.

(vi) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

**6.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය:-

i. උප්පැන්න සහතිකය;
ii. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්;
iii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
iv. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
v. පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

**7.** රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**8.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**9.** අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප

කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර,**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2025 දෙසැම්බර් මස 15 දින.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම්පත්‍රය

**................................................ *තනතුර***

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..........................................................................................
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..........................................................................................
   (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය/මෙනෙවිය) ..................................................
   ..........................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................

   (ii) විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) : ..........................................................................

   (iii) දුරකථන අංකය : | | | | | | | | | | |

   (iv) Whatsapp දුරකථන අංකය : | | | | | | | | | | |

   (ආ) (i) කාර්යාලයීය ලිපිනය : ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................

   (ii) දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න :

පෞද්ගලික ☐ රාජකාරි ☐

4. (අ) උපන් දිනය : වර්ෂය ............... මාසය............... දිනය ...............
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු ............... මාස ............... දින .................

5. විවාහක/අවිවාහක බව : ..................................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ..................................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය):

| *උපාධිය* | *ආයතනය* | *ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

| *විභාගය* | *විෂයයන්* | *සාමාර්ථ්‍ය* | *වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස. (උ/ පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස. (සා/ පෙළ) | සිංහල / දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය):

| *පාඨමාලාව* | *ආයතනය* | *කාල පරිච්ඡේදය* | *ක්‍රියාත්මකවන දිනය (Effective date)* |
|---|---|---|---|
| | | | |
| | | | |

| පාඨමාලාව | ආයතනය | කාල පරිච්ඡේදය | ක්‍රියාත්මකවන දිනය (Effective date) |
|---|---|---|---|
| | | | |
| | | | |

10. වෙනත් සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය):
..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

11. පළපුරුද්ද (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු ය)

| ආයතනය | තනතුර | සේවා කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර (අදාළ ලේඛන අමුණා තිබිය යුතු ය):
(අ) ආයතනයේ නම හා ලිපිනය : ..............................................................................................
..............................................................................................
..............................................................................................
(ආ) මුල් පත්වීමේ දිනය : ..............................................................................................
(ඇ) දැනට දරන තනතුර : ..............................................................................................
(ඈ) මාසික මූලික වැටුප : ..............................................................................................
(ඉ) දීමනා : ..............................................................................................
(ඊ) දළ වැටුප : ..............................................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද? (ඔව්/ නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න : ..............................................................................................
..............................................................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/ නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න : ..............................................................................................
..............................................................................................................................................................

*ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.*

දිනය : ................................ ....................................................,
අයදුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

*(රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ....................................... තනතුර දරන ........................................................ මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය : .....................................

............................................................,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

12 - 436

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට 2025 **කොළඹ දී** පැවැත්වීමට නියමිත විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

වගුව - අංක 01

| *අනු. අංකය* | *තනතුරු නාමය* | | *සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු ගණන* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| 01 | සිතියම් තාක්ෂණ නිලධාරී | | 45 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 02 | ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරී | මෙම තනතුරුවලට අදාළ රාජකාරී කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට පමණක් සීමාවන බැවින් මුළු සේවා කාලය තුළ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු වේ. | 13 | |
| 03 | දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරී | | 04 | |
| 04 | ලිතෝ තාක්ෂණ නිලධාරී | | 05 | |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය:

වගුව - අංක 02

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *රාජකාරී ස්වභාවය/ ප්‍රධාන කාර්යයන්* |
|---|---|---|
| 01 | සිතියම් තාක්ෂණ නිලධාරි | තේමා සිතියම්, භූ ලක්ෂණාත්මක සිතියම්, සහ අනෙකුත් සිතියම්වල දත්ත සැකසුම, දත්ත පද්ධතිවලට දත්ත ඇතුළත් කිරීම, දත්ත පද්ධති ඇසුරෙන් සිතියම් නිෂ්පාදනය, පුණරීක්ෂණය, තත්ත්ව පාලනය, අලෙවිය ඇතුළු සිතියම් නිෂ්පාදනයට අදාළ අනෙකුත් තාක්ෂණ කටයුතු, මැනුම් පිළිබඳ කාර්යාලයීය මූලික හා අවසන් කටයුතු, මහජනයාට පිඹුරු පිටපත් නිකුත් කිරීම, ඊට අදාළ ලේඛන පවත්වාගෙන යාම, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ මැනුම් දත්ත පද්ධතිවල කටයුතු |
| 02 | ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරි | ගුවන් ඡායාරූප ආධාරයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිතියම් සැකසීමට අදාළ දත්ත රැස්කිරීම |
| 03 | දූරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි | ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා දත්තයන්ගේ අර්ථ නිරූපණය, විශ්ලේෂණය හා එමගින් සිතියම් සැකසීමට අදාළ දත්ත රැස් කිරීම, ඒවා පරිගණකගත කිරීම, අවශ්‍ය දත්ත ලබා දීම |
| 04 | ලිතෝ තාක්ෂණ නිලධාරි | සිතියම් හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් මුද්‍රණ කටයුතු කිරීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප :

වගුව - අංක 03

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* |
|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය | පළමු වසර දීමනාව මාසිකව රු.41,317/-<br>දෙවන වසර දීමනාව මාසිකව රු.41,689/-<br>(රා.ප.ච.10/2025 හි උපලේඛන VI විධිවිධාන අනුව) |
| III ශ්‍රේණිය | මාසිකව රු.52,250 - 10 x 800 - 11 x 1,190 -10 x 1,320 - 10 x 1,350 - රු.100,040<br>(MN 3 – 2025) |
| II ශ්‍රේණිය | මාසිකව රු.52,250 - 10 x 800 - 11 x 1,190 -10 x 1,320 - 10 x 1,350 - රු.100,040<br>(12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(MN 3 – 2025) |
| I ශ්‍රේණිය | මාසිකව රු.52,250 - 10 x 800 - 11 x 1,190 -10 x 1,320 - 10 x 1,350 - රු.100,040<br>(23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(MN 3 – 2025) |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු.71,240 - 11 x 1,360 - 18 x 1,850 - රු.119,500<br>(MN 7 – 2025) |

4.0 තනතුරෙහි සේවා කොන්දේසි:-

4.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් අදාළ තනතුරු සඳහා පවත්වනු ලබන දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් සහිත තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරු, ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතවන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ. තව ද, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

4.4 සිතියම් තාක්ෂණ නිලධාරි තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ව සිටිය යුතු ය.

4.5 තෝරා ගනු ලබන්නන් මෙම *ගැසට් පත්‍රයේ* ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළවන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද යටත් වේ.

4.6 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.

4.7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුවේ.

4.8 III ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර සන්ධාන භාෂාවවන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය.

4.9 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවට ද, දෙවසරක පුහුණුවෙන් පසු වසර 06ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, සර්වේයර් ජනරාල්වරයා සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, නිලධාරියා / නිලධාරිනිය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් හෝ ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවන මුදල වන රු.150,000 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ඇපකරුවන් දෙදෙනකුගේ සහතික වීම සහිතව බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතු ය.

5.0 සුදුසුකම් :-

5.1 සියලු තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් :

සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයන් දෙකක් (02) සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

5.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.3 වෙනත්:

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි

iv. සේවයට බඳවා ගැනීම සඳහාවන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

6.0 වයස :-

6.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
6.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.0 පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය :-

සර්වේයර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල සහ තනතුර සඳහා පළ කරන ලද මනාපය යන කරුණු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.1 ලිඛිත විභාගය :-

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

වගුව අංක - 04

| *විෂයයන්* | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% | පැය 02 |

7.1.1 විෂය නිර්දේශය :

I. බුද්ධි පරීක්ෂණය :
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

II. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය:

ගණිතය

- වීජ ගණිතය (අසමානතා,විචලා, ශ්‍රේණි, ලඝු ගණක)
- ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
- සංඛ්‍යානය (මධ්‍යනාසය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

භෞතික විද්‍යාව ;

- ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය,දර්පන,වක්‍ර පෘෂ්ඨය, ප්‍රිස්ම,කාච, ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය)
- නිව්ටන් යාන්ත්‍රික විද්‍යාව (අදිශ සහ දෛශික,චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

විවිධ මාතෘකා ;

- භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
- ඝණ වස්තුවල කෝණික දෘෂ්ඨිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.

7.2 විභාග ප්‍රතිඵල :-

අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම සර්වේයර් ජනරාල්වරයා විසින් තැපැලෙන් හෝ www.survey.gov.lk වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ.

7.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:-

සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

8.0 පුහුණු කාලසීමාව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගැනීම :

1. පුහුණු ශ්‍රේණිය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ආයතනය මගින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරන සහතිකය ඉදිරිපත් කිරීමෙන් III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත්වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත්වන ආධුනිකයින්ගේ තනතුර අවසන් කරනු ලැබේ.

9.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම :

9.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ.මී 21 x 29(ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 3.8 දක්වා ශීර්ෂ පළමු පිටුවෙහිද, අංක 04 සිට 9.1 දක්වා ශීර්ෂ 02 පිටුවෙහි ද, අංක 10 සිට 14 දක්වා ශීර්ෂ 03 පිටුවෙහි ද ඇතුළත්වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

9.2 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්වන අතර භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන බැවින් නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

9.3 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

9.4 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ශ්‍රේණිගත කිරීම අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.0 අයදුම්පත්‍ර භාර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:

10.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය, නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

10.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

**10.3** ***ගැසට්* නිවේදනයේ 5 ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි** යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු.800 කි.මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබා ගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 අයදුම්පත් යොමු කිරීම :

12.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.01.16 වැනි දින හෝ ඊට පෙර** පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ.පෙ.506,
කොළඹ 05.

12.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වුවන් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඉන් පෙර ඉදිරිපත් කළ යුතු වේ.

12.3 අයදුම්පත බහා එවන කවරයේ වම් පස කෙළවරේ

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ - විවෘත තරග විභාගය 2025 "** යනුවෙන් අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

***සැ.යු.* 2026.01.16** දිනෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර ගනු නොලැබේ.

12.4 ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 3 හෝ 4 ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ බව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් විමසිය හැක.

13.0 සාවද්‍ය තොරතුරු සැපයීම :-

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ලැබේ.

14.0 විභාගයට පෙනී සිටීම :

විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතුය. විභාග මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.

15.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එන්.කේ.යූ.රෝහණ,
සර්වේයර් ජනරාල්.

2025 දෙසැම්බර් මස 05 දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
***මිනින්දෝරු දෙපාර්තමේන්තුව***

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2025**
**Open Competitive Examination for Recruitment to Training Grade Posts in Sri Lanka Technological Service - 2025**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐ (සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටුව තුළ අදාළ අක්ෂරය යොදන්න)

2.0 බඳවා ගැනෙන තනතුරු අතරින් පත්වීම ලැබීම සඳහා මනාප අනුපිළිවෙල:

වැඩිම මනාපය සහිත තනතුර සඳහා අංක 01 ද, මනාපය අඩුවන අනුපිළිවෙල අනුව අනෙකුත් තනතුරු සඳහා 02,03.... වශයෙන් අනුපිළිවෙලින් මනාප අංක සටහන් කරන්න

| තනතුරු නාමය | මනාප අංකය |
|---|---|
| සිතියම් තාක්ෂණ නිලධාරි | |
| ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරි | |
| දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි | |
| ලිතෝ තාක්ෂණ නිලධාරි | |

3.0 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම: ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා:* PERERA A.B.C.

3.1 සම්පූර්ණ නම:..........................................................................................
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

3.2 සම්පූර්ණ නම:..........................................................................................
..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

3.4 උපන් දිනය: වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

3.5 2026.01.16 දිනට වයස: අවු: | | | මාස: | | | දින: | | |

3.6 ස්ත්‍රී/පුරුෂ භාවය: (පුරුෂ - M ස්ත්‍රී - F) | |

3.7 විවාහක/අවිවාහක බව : විවාහක: | | අවිවාහක: | | (අදාළ කොටුව තුළ " ✓" ලකුණ යොදන්න)

3.8 ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

4.0 ස්ථිර ලිපිනය :..........................................................................................
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.1 ස්ථිර ලිපිනය :..........................................................................................
..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

4.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..............................................................................................................................
..............................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.3 දුරකථන අංකය (තිබේනම්) : ..............................................................................................................................

5.0 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..............................................................................................................................

5.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..............................................................................................................................
5.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ..............................................................................................................................

6.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතු ය)

6.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
i. විභාගයේ වර්ෂය හා මාසය: ..............................................................................
ii. විභාග අංකය : ..........................
iii. ප්‍රතිඵලය:

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10 | |

6.2 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය: ...................
ii. විභාග අංකය: ..........................
iii. ප්‍රතිඵලය:

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |

7.0 වෘත්තීය/තාක්ෂණික සුදුසුකම්: (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

7.1 හදාරා ඇති උපාධිය/ පාඨමාලාව : ..............................................................................................................................
7.2 උපාධිය/පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම: ..............................................................................................................................
7.3 උපාධියේ/පාඨමාලාවේ කාලය : ..............................................................................................................................

8.0 වෙනත් සුදුසුකම් :

..............................................................................................................................................................
..............................................................................................................................................................

09. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේද?(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)
ඔව් ☐ නැත ☐

9.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න :....................................................................................................................

10.0 ඔබ මීට පෙර රජයේ /පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව:

..........................................................................................................................................................

11.0 විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ විස්තර :

11.1 විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාල.......................................................................................................
11.2 ලදුපත් අංකය හා දිනය ..........................................................................................................................
11.3 ගෙවූ මුදල : රු.......................................

| |
|---|
| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

12.0 අයදුම්කරුගේ සහතිකය :

- මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අහිතකර තත්ත්වයන් විඳදරා ගැනීමට එකඟ වේ. තවද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

- මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

- තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කර සිටිමි.

- මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :................................ .......................................................,
අයදුම්කරුගේ අත්සන.

13.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..............................................................................මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය................................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

දිනය: ............................... .......................................................,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................................................................
තනතුර : ..........................................................................................................................................
ලිපිනය: ..........................................................................................................................................
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

14.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරින් සඳහා පමණක් අදාළ වේ. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය-

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති.....................................................................................................මයා/මිය/මෙය ............. ..................................දෙපාර්තමේන්තුවේ/ආයතනයේ........................... දින සිට .....................දින දක්වා ........................ .................................................වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/ නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක /අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

............................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

12 - 407

---

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරු වලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය - 2025

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීමට **කොළඹ දී** පැවැත්වීමට නියමිත විවෘත තරඟ විභාගයට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තනතුරේ ස්වභාවය :

මැනුම් කටයුතු වලට අදාල උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම සහ සේවා කිරීම.

2. 2.1 පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර :

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100% | 40% |

2.2 විෂය නිර්දේශය:

I. බුද්ධි පරීක්ෂණය :

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තාවයන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

II. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :

- ජ්‍යාමිතික ප්‍රකාශ විද්‍යාව (වක්‍ර දර්පන වලින් සිදුවන පරාවර්තනය, ප්‍රිස්ම කාච හා විවිධ මාධ්‍ය තුළින් සිදුවන වර්තනය, මිනිස් ඇස, අන්වීක්ෂ, දුරේක්ෂ)
- ධාරා විද්‍යුතය (සරල ධාරා විද්‍යුතය, ඕම් ගේ නියමය, කර්චොෆ් නියමය, විභව අන්තරය, ධාරාව මැනීමේ ක්‍රම)
- චුම්භකත්වය (විද්‍යුත් චුම්භකත්වය)
- ස්ථිතික විද්‍යුතය (කූලෝම් නියමය)
- තරංග (විද්‍යුත් චුම්භක තරංග)
- ඉලෙක්ට්‍රොනික භෞතික විද්‍යාව (අර්ධ සන්නායක ඩයෝඩ සහ ට්‍රාන්සිස්ටර්)
- තාපය (ප්‍රසාරණය, රේඛීය ප්‍රසාරණතා සංගුණකය)
- ගණිතය (ත්‍රිකෝණමිතික ශ්‍රිත, නිව්ටන් භෞතික විද්‍යාව, ද්‍රවස්ථිති විද්‍යාව)

2.3 මෙම ප්‍රශ්න පත්‍ර වලට ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව මත තේරීම් කරනු ලැබේ.

3. බඳවා ගැනීමේ ශ්‍රේණිය :

මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරේ III ශ්‍රේණිය

4. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. තෝරා ගනු ලබන නිලධාරීන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. මෙම *ගැසට්* නිවේදනය ආරම්භයේ ඇති රාජ්‍ය සේවයේ පත්කිරීම් වලට අදාල වන පොදු කොන්දේසි වලට යටත් විය යුතු ය.

5. වැටුප් පරිමාණය :

MT1 - 2025 රු.50,090 - 10 x 540 - 11 x 630 - 10 x 1,010 - 10 x 1,190 - රු. 84,420/-

- මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2025.04.01 දින සිට වන අතර, රා.ප.ච. 10/2025 හි උපලේඛණ **II** අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III | පියවර 01 | රු.50,090/- |
| II | පියවර 12 | රු.56,120/- |
| I | පියවර 23 | රු.63,430/- |

6. වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර වයස 35 ට නොවැඩි විය යුතු ය.

7. සුදුසුකම් :

7.1 අධ්‍යාපන සුදුසුකම්

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවරක දී විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.1 වෘත්තීය සුදුසුකම්

තනතුරට අදාලව ඉලෙක්ට්‍රොනික් හෝ යාන්ත්‍රික විද්‍යාව පිලිබඳ වූ NVQ 05 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

7.2 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.3 වෙනත්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 සිට 7.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

9. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර:

(අ.) I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම්පත්‍ර සකසා ගත යුතු අතර ඉල්ලුම්පතේ 01 වැනි පිටුවේ අංක 01 සිට 04 දක්වාත්, 02 වන පිටුවේ අංක 05 සිට 09 දක්වාත්, 03 වන පිටුවේ අංක 10 සිට 12 දක්වාත් ඡේදයන් ඇතුලත් විය යුතු අතර විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර - විවෘත" යනුවෙන් සඳහන් කර

**2026.01.16** දින හෝ ඊට පෙර සර්වේයර් ජනරාල්, විභාග අංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැ.පෙ. 506, කොළඹ 05. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතු ය.)

II. අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

IV. මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකරයි.

V. ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(*ආ.*) ඉල්ලුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ශ්‍රේණිගත කිරීම අනුව ජ්‍යෝෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය හැක.

11. පහත සඳහන් ලියවිලිද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සහතික,
III. මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකයක්,
IV. චරිත සහතික දෙකක්.

***සැලකිය යුතුයි :-*** **අධ්‍යාපන, වෘත්තීය හා උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.**

12. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු ය.

13. විභාග ගාස්තුව රු.800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවා ලබා ගත් රිසිට්පත, අයදුම්පතේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතු ය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

14. විභාගයට ඇතුලුවීම :

ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පල කරනු ලැබේ. අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. නිවේදනය පළවී දින 3 හෝ 4 ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ බව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් විමසිය හැක. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

***සටහන -*** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.

15. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේදී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(*අ.*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත.

(*ආ.*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

16. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු / ඇය එහි සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු / ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු / ඇය රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

17. භාෂා මාධ්‍යය :

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර අයදුම්කරුවන්ට කැමති මාධ්‍යකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

18. විභාග ප්‍රතිඵල :

අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම සර්වේයර් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ www.survey.gov.lk වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ.

19. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කෙරෙනු ඇත.

එන්.කේ.යූ.රෝහණ,
සර්වේයර් ජනරාල්.

2025 දෙසැම්බර් මස 05 දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 සඳහා ආදර්ශ අයදුම්පත

Specimen Application Form for the open Competitive Examination for recruitment to the Post of Survey Instrument Technician Grade III -2025 in the Department of Survey.

ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද ඇතුලත් කළ යුතු ය.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම: ..................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA,A.B.C.

1.2 සම්පූර්ණ නම: ...................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම: ...................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී - 1
පුරුෂ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය :...........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :...........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ...........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය : ....................................................

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ....................................

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..........................................

3.3 පදිංචිව සිටින කාල සීමාව : ..................................................

3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ................................................

4.0 උපන් දිනය : වර්ෂය................. මාසය.................. දිනය.................
2026.01.16 වැනි දිනට වයස : අවු:........... මාස:.............. දින:..................

5.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතු ය)
අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය: ...................

(ii) විභාග අංකය : ..........................

(iii) ප්‍රතිඵලය: ................................

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4<br>5 | | 6.<br>7.<br>8.<br>9.<br>10. | |

6.0 වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතු ය)

6.1 හදාරා ඇති පාඨමාලාව : ..........................................................................................................

6.2 පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම: ........................................................................................

6.3 පාඨමාලාවේ කාලය : .............................................

7.0 වෙනත් සුදුසුකම් :

..........................................................................................................................................

..........................................................................................................................................

8.0 ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ √ ළකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න :.......................................................................................................

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :...................
(ii) ලදුපත් අංකය හා දිනය : ..........................
(iii) ගෙවූ මුදල : රු..................................

| |
|---|
| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වේ. තවද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කර සිටිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :................................. ..................................................

අයදුම්කරුගේ අත්සන

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

දිනය: ................................ ........................................

සහතික කරන්නාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .....................
තනතුර : ...............
ලිපිනය: .................
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

12.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතන වල සේවය කරන නිලධාරින් සඳහා පමණක් අදාළ වේ.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය-

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති........................මයා/මිය/මෙය.............දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................... දින සිට .....................දින දක්වා ............වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක /අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ...................... තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

...........................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

12 - 408

---

## සංශෝධනයයි

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

2025.10.31 දින ගැසට් නිවේදනය සංශෝධනය කිරීම.

2025.10.31 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2461 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාලවලට 2026 වසර සඳහා සිසුන් ඇතුළත් කරගැනීම සඳහා වු ගැසට් නිවේදනයට පහත සඳහන් සංශෝධන සිදුකෙරේ.

ටී. බාබු,
අධ්‍යක්ෂ ජනරාල්.
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

| *අනු අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *සංශෝධනය විය යුතු ආකාරය* |
|---|---|---|---|
| **13.** | G50S003F4.3 | මෝටර් වාහන කාර්මික ශිල්පි<br><br>Automobile Mechanic<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 ½ | NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් හෝමාගම කාර්මික විද්‍යාලය ඇතුලත්වේ. |
| **22.** | G50S001F4.2 | මෝටර් රථ වායුසමන කාර්මික ශිල්පී<br><br>AUTOMOBILE AIR CONDITIONING TECHNICIAN<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 | NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් හෝමාගම කාර්මික විද්‍යාලය ඇතුලත්වේ. |

| අනු අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|---|
| **32.** | ETC 24 | **ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය**<br><br>National Certificate in Engineering **Draughtsmanship**<br><br>(F45S009)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 | NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් හෝමාගම කාර්මික විද්‍යාලය ඇතුලත්වේ. |
| **175A.** | **A01T003F6.1** | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව<br><br>Higher National Diploma in Agricultural Production Technology<br><br>**පූර්ණ කාලීන,**<br>**අවුරුදු 01** | **ඇතුලත් වීමේ සුදුසුකම් ලෙස**<br><br>**1.අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 5 සහතිකය ලබා තිබීම.**<br><br>**පැවැත්වෙන විද්‍යාල**<br>**අම්පාර, දඹුල්ල, හසලක, කුලියාපිටිය, වරකාපොල, සම්මන්තුරේ, ඇඹිලිපිටිය** |
| **176.** | **A01T003P6.1** | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව<br><br>Higher National Diploma in Agricultural Production Technology | **පාඨමාලා කාලය අර්ධ කාලීන අවුරුදු 01 ½ ලෙස සංශෝධනය කෙරේ.** |
| **177.** | A01T003P5.1 | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව<br><br>National Diploma in Agricultural Production Technology | **පාඨමාලා කාලය අර්ධ කාලීන අවුරුදු 01 ½ ලෙස සංශෝධනය කෙරේ.** |

12 - 435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.